# 8. ජනතාවට මග පෙන්වීම

ජේසුස් වහන්සේගේ මෙලොව සේවය පටන් ගැනීමට පෙර එතුමා ව බව්තීස්ම කළේ ස්නාවක ජොහාන් ය. ඔහු ජෝර්දාන් ගඟ අසල සිටිමින් ජනතාවට හොඳ දේ ගැන කතා කළා. ඒ දේශනාවල පුංචි අපටත් ඉගෙන ගන්න බොහෝ දේ තියෙනවා.

හිමි නම් මට ඇඳුම් දෙකක්
දෙන්නෙමි ඉන් එක ඇඳුමක්
නැති බැරි ළමයෙක් දුටුවොත්
සතුටු සිතින් මම්

හිමි නම් රස අහර රුසක්
දෙන්නෙමි ඉන් එක කොටසක්
නැති බැරි කෙනෙකුන් දුටුවොත්
සතුටු සිතින් මම්

හිමි නම් මට යම් මුදලක්
මගේ වෙහෙස මහන්සියට
හරි කොටසට වඩා යමක්
නොපතන්නෙමි මම්

මා හට හිමි නොමැති දෙයක්
කිසි විටෙකත් මට හිමි යයි
සිතා බලෙන් ලබාගන්න
නොපතනෙමි මම්

පුංචි අපට අවැසි දෙයක්
දෙන දෙව්දුට හද බැතියෙන්
උදේ සවස සතුටු සිතින්
තුති දෙන්නෙමි මම්

## පැවරුම්

1. ජේසුස් වහන්සේව බව්තීස්ම කළේ කවුදැයි ලියන්න.

2. තමා සතු ආහාරයෙන් කොටසක් තවත් අයට දී සතුටු වීමේ පුරුද්දක් ඇති කර ගන්න.